SC

FAC... 29 SEP 2010 ... UNIVERSITY OF KELANIYA

# පැරණි භාරතීය කාන්තාව සහ පැරණි ලාංකීය කාන්තාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

ඉන්දියාව - වෛදික යුගයේ සිට ගුප්ත යුගය දක්වා
ලංකාව - ක්‍රි.පූ. 6 වෙනි සියවසේ සිට ක්‍රි.ව. 13 වෙනි සියවස දක්වා

**ශිෂ්‍ය අංකය - FGS / H / MSSC / 2007 / 10**



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 654 |
| වර්ග අංකය | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති උපාධි (ඉතිහාසය) පරීක්ෂණයෙහි එක් අවශ්‍යතාවයක් පරිපූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනයකි.

(2008 මැයි / ජූනි)

## සාරාංශය


මව, භාර්යාව, දියණිය, සොයුරිය පොදුවේ ගත් කල කාන්තාව යනුවෙන් තනි වචනයකින් හැඳින්විය හැකිය. නමුත් ලෝකයේ විවිධ සංස්කෘතීන් තුළ ඇයට හිමි වූ තත්ත්වයත්, ඇගේ කාර්යභාරයත් අසමාන විය. ස්ත්‍රියත් පුරුෂයාත් අතර කායික, මානසික වශයෙන් පවත්නා වෙනස්කම් පදනම් කරගනිමින් ස්ත්‍රියට වඩා පුරුෂයා ශක්තිමත්ය, ඥානවන්තය යන මතය පෙරදිග ලෝකයේ බොහොමයක් රටවල පිළිගැනීම වී තිබිණි. ඇගේ ක්‍රියාකාරකම් හැඩගැසීම සඳහා ආගමික පරිසරය බොහෝසෙයින් බලපෑම් කර ඇත. පැරණි ලක්දිව දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික පසුතලය නිර්මාණය වීමේදී ඉන්දීය ආභාසය ඒ අංශ සියල්ලෙන්ම පිළිබිඹු වේ. එනිසා පැරණි භාරතීය හා පැරණි ලාංකීය කාන්තාව දෙස තත්කාලීන සමාජ විසින් හෙලන ලද දෘෂ්ටියෙහි සමාන අසමානතා පිළිබඳවත්, ඇගේ සැබෑ ක්‍රියාකාරිත්වය කෙසේ වීද යන්න පිළිබඳවත් විමසා බැලීම වැදගත් වේ.

භාරතීය කාන්තාව හෙලා දකින බ්‍රාහ්මණ මතවාද ස්මෘති ග්‍රන්ථයන්හි සඳහන් වුවද සැබවින්ම එය ඒ ආකාරයෙන්ම ප්‍රායෝගික සමාජය තුළ ක්‍රියාත්මක වූවාද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ එක් අරමුණකි. භාරතීය සංස්කෘතියේ අභාසය ලාංකීය සමාජය කෙරෙහි කෙතෙක් දුරට බලපෑම් කළ ද භාරතීය ධර්ම ශාස්ත්‍රයන්හි සඳහන් වන ආකාරයට, භාරතයේ මෙන් මෙරට කාන්තාවගේ අයිතීන් පුරුෂාධිපත්‍යය විසින් ගිලගැනීමක් සිදු නොවුණ බවත්, ඊට හේතුව වූයේ මෙරට සංස්කෘතිය භාරතීය වෛදික බලපෑම් ද, මෙරට ආදිවාසීන්ගේ බලපෑම් ද මූලිකවම බෞද්ධ බලපෑම ද යන ත්‍රිත්වයේ සංකලනයක් මත ගොඩනැගුණක් වීම නිසා යැයි පෙන්වා දීම ද මූලික අරමුණක් වී ඇත.

වෛදික ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් ගුප්ත යුගය දක්වා කාල පරිච්ඡේදය පැරණි භාරතීය කාන්තාව පිළිබඳව අධ්‍යයනය කිරීමේදී වඩාත් වැදගත් වේ. එමගින් විශාල කාල පරාසයක් තුළ භාරතීය වනිතා සමාජය තුළ සිදු වූ වෙනස්කම් පැහැදිලිව අවබෝධ කරගත හැකිය. ඊට සමගාමීව පැරණි ලක්දිව කාන්තාව පිළිබඳව අධ්‍යයනයේදී ක්‍රි. පූ. 6 වන සියවසේ පටන් පොළොන්නරු යුගයේ අවසානය දක්වා කාලපරිච්ඡේදය යොදා ගැනිණි.

මෙම අධ්‍යයනය මූලික වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය පදනම් කරගනිමින් සිදු කෙරේ. එහිදී තොරතුරු ලබාගතහැකි සාහිත්‍යමය මූලාශ්‍රය, අභිලේඛන මූලාශ්‍රය මෙන්ම මූර්ති , කැටයම් වැනි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පිළිබඳව විමසීම සඳහා පළමුවන පරිච්ඡේදයෙන් අවධානය යොමු කෙරේ.

භාරතීය සමාජය වනිතාව පිළිබඳව දැරූ මතවාදයන් ද, බුදුන්වහන්සේගේ පහළ වීමත් සමග කාන්තාව ලැබූ විමුක්තිය පිළිබඳව ද, පැරණි භාරතීය කාන්තාවට වඩා ලාංකීය කාන්තාව බුදුදහමින් ලැබූ ආලෝකය හා කාන්තාව පිළිබඳව ලාංකීයයන් දැරූ ආකල්පයන් ද දෙවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරනු ලැබේ.

ගෘහය තුළ සිදුවන දෛනික ක්‍රියාකාරකම්වලදී ප්‍රමුඛව කටයුතු කරන්නේ කාන්තාවයි. මව, දියණිය, භාර්යාව වශයෙන් විවිධ කාන්තා චරිත රැසක් ගෘහය තුළ දක්නට ලැබේ. දියණියකට පවුල තුළ හිමි වූ ආදරය, රැකවරණය පිළිබඳවත්, ඇය විවාහ වීමේදී ඒ පිළිබඳ තීරණ ගැනීමට ඇයට ලැබුණ නිදහස පිළිබඳවත්, විවාහයෙන් පසු බිරියක හා මවක වශයෙන් ඇයට පවුල තුළ හිමි වූ තත්ත්වය හා ඇගේ කාර්යභාරය පිළිබඳවත් දෙරට අතර සමානතා මෙන්ම අසමානතා ද බොහෝය. ඒ පිළිබඳව තුන්වන පරිච්ඡේදයෙන් විමසා බලනු ලැබේ.

බ්‍රාහ්මණ සමාජය කාන්තාව ආගමික කටයුතුවලින් මුළුමනින්ම ඈත් කර තැබීමට උත්සාහ කළ ද බුදුන්වහන්සේ පහළ වීමත් සමග කාන්තාවගේ ආගමික නිදහස වර්ධනය වී ගියේය. නමුත් ඉන්දීය සමාජයටත් වඩා බුදුදහමේ ආලෝකය ලැබුණේ ලක්දිවට බැවින් ලාංකීය කාන්තාව ආගමික කටයුතුවලදී පුරුෂ පක්ෂය අබිබවා යාමට පවා සමත් වූ බවක් ඇතැම් විට දක්නට ලැබේ. කාන්තාවගේ ආගමික නිදහස, උපාසිකාවක වශයෙන් සිදු කළ ආගමික මෙහෙවරත්, පැවිදි වීමෙන් පසු ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇගෙන් ඉටු වූ මෙහෙයත් පිළිබඳව හතරවන පරිච්ඡේදයෙන් අවධානය යොමු කෙරේ.

කෘෂිකර්මාන්තය පදනම් කරගත් ස්වයංපෝෂිත අර්ථක්‍රමයක් තුළ කාන්තාව සතු කාර්යභාරයන් විවිධ විය. දරුවන් හදාවඩා ගැනීම, ආහාර පිසීම ඇතුළුව විවිධ කර්මාන්තයන්හි යෙදීමට ද ඇයට සිදු විය. ඒ අනුව පවුලේ සහ රටේ ආර්ථික ක්‍රියාවලිය උදෙසා දෙරටෙහිම කාන්තාව ලබා දුන් දායකත්වය පිළිබඳව පස්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

අධ්‍යාපන හා දේශපාලන කටයුතු සම්බන්ධයෙන් කාන්තාවගේ දායකත්වය භාරතීය සමාජයට වඩා පැරණි ලාංකීය සමාජය තුළ වඩාත් ඉදිරියෙන් තිබිණි. දෙරට අතර වූ මේ විෂමතාවයට හේතු වූ කරුණු පිළිබඳව මූලික වශයෙන් හයවන පරිච්ඡේදයෙන් අවධානය යොමු වේ.

මෙහිදී සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාක්ෂි අධ්‍යයනය කිරීම තුළින් හා විද්වතුන් ඒ පිළිබඳව ඉදිරිපත් කර ඇති මතවාදයන් ද සාකච්ඡා කරමින් මධ්‍යස්ථව කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ කෙරෙනු ඇත.